# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2306/35 - 2022 නොවැම්බර් මස 16 වැනි බදාදා - 2022.11.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2007

**1981 අංක 4 දරන කොන්සල් කර්තව්‍ය පනත**

8 වන වගන්තිය යටතේ වූ නිවේදනය

1981 අංක 4 දරන කොන්සල් කර්තව්‍ය පනතේ 8 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශ කටයුතු අමාත්‍ය මොහොමඩ් උවෙයිස් මොහොමඩ් අලි සබ්‍රි වන මා විසින්, මේ නිවේදනය මගින්, 2023 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි-

(අ) මෙහි I වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සල් අංශය මගින් සහ එහි ප්‍රාදේශීය කාර්යාල මගින් ඉටු කරනු ලබන්නා වූ ද, කොන්සල් කර්තව්‍ය සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයෙහි දක්වා ඇති ගාස්තු අය කරනු ලැබිය යුතු බවඃ සහ

(ආ) මෙහි II වන උපලේඛනයේ I වන තීරයෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හෝ දූත කාර්යාල මගින් ඉටු කරනු ලබන්නා වූ ද, කොන්සල් කර්තව්‍ය සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයෙහි දක්වා ඇති ගාස්තු අය කරනු ලැබිය යුතු බව,

නිශ්චිතව දක්වා සිටිමි.

2017 නොවැම්බර් මස 09 වන දින අංක 2044/39 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද, විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සල් අංශය මගින් ඉටු කරනු ලබන කොන්සල් කර්තව්‍ය සම්බන්ධයෙන් වූ ගාස්තු නිශ්චිතව දක්වනු ලබන්නා වූ නිවේදනය සහ 2018 පෙබරවාරි මස 09 වන දින අංක 2057/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හෝ දූත කාර්යාල මගින් ඉටු කරනු ලබන කොන්සල් කර්තව්‍ය සම්බන්ධයෙන් වූ ගාස්තු නිශ්චිතව දක්වනු ලබන්නා වූ නිවේදනය, ඒ නිවේදන යටතේ සිදු කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

## I වන උපලේඛනය

*විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සල් අංශය මගින් සහ එහි ප්‍රාදේශීය කාර්යාල මගින් ඉටු කරනු ලබන කොන්සල් කර්තව්‍ය සම්බන්ධයෙන් වන ගාස්තු*

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *කොන්සල් කර්තව්‍ය* | *ගාස්තු* |
| **කොන්සල් අංශය මගින් සහ එහි ප්‍රාදේශීය කාර්යාල මගින් ලේඛන සත්‍ය බවට සහතික කිරීම** | |
| 1. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන විභාග සහතික | රු. 800.00 |
| 2. විදේශීය ජාතිකයෙකුට ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන යම් ලේඛනයක් | රු. 3000.00 |
| 3. යම් අපනයන ලේඛනයක් | රු. 8000.00 |
| 4. වෙනත් යම් ලේඛනයක් | රු. 1200.00 |

## II වන උපලේඛනය

*විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හෝ දූත කාර්යාල මගින් ඉටු කරනු ලබන කොන්සල් කර්තව්‍යයන් සම්බන්ධයෙන් වන ගාස්තු*

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *කොන්සල් කර්තව්‍ය* | *ගාස්තු* |
| **1. විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සත්‍ය බවට සහතික කරවාගැනීම පිණිස විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හෝ දූත කාර්යාල මගින් ඉලෙක්ට්‍රොනික ලේඛන සහතික කිරීමේ පද්ධතිය (e-DAS) හරහා ලේඛනයක් භාර ගැනීම සහ උඩුගත කිරීම (Uploading)** | |
| (1) ලේඛන හිමියා ශ්‍රී ලාංකික ජාතිකයෙකු වන අවස්ථාවක දී | ඇ.ඩො. 37 |
| (2) ලේඛන හිමියා විදේශීය ජාතිකයෙකු වන අවස්ථාවක දී | ඇ.ඩො. 49 |
| **2. උපත් ලියාපදිංචි කිරීම** | |
| (1) උප්පැන්න සහතිකයක් ලියාපදිංචි කිරීම සහ නිකුත් කිරීම | ඇ.ඩො. 37 |
| (2) උප්පැන්න සහතිකයක සහතික කරන ලද පිටපතක් නිකුත් කිරීම | ඇ.ඩො. 22 |
| **3. මරණ ලියාපදිංචි කිරීම** | |
| (1) මරණ සහතිකයක් ලියාපදිංචි කිරීම සහ නිකුත් කිරීම | ඇ.ඩො. 22 |
| (2) මරණ සහතිකයක ලියාපදිංචි කරන ලද පිටපතක් නිකුත් කිරීම | ඇ.ඩො. 22 |
| **4. විවාහ ලියාපදිංචි කිරීම** | |
| (1) විවාහයක් පිළිබඳ දැන්වීම (සාමාන්‍ය/උඩරට) | ඇ.ඩො. 30 |
| (2) විවාහයක් ලියාපදිංචි කිරීම සහ විවාහ සහතිකයක් නිකුත් කිරීම (සාමාන්‍ය/උඩරට/මුස්ලිම්) | ඇ.ඩො. 47 |
| (3) විශේෂ බලපත්‍රයක් යටතේ විවාහයක් ලියාපදිංචි කිරීම (සාමාන්‍ය/උඩරට) | ඇ.ඩො. 60 |
| (4) විවාහ සහතිකයක සහතික කරන ලද පිටපතක් නිකුත් කිරීම (සාමාන්‍ය/උඩරට/මුස්ලිම්) | ඇ.ඩො. 22 |

| *I වන තීරය*<br>*කොන්සල් කර්තව්‍ය* | *II වන තීරය*<br>*ගාස්තු* |
|---|---|
| (5) 24 වන වගන්තිය යටතේ විවාහ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම (විවාහය පිළිබඳ දැන්වීම) | ගාස්තු අය නොකෙරේ |
| **5. ලේඛනවල සාක්ෂි දැරීම, සහතික කිරීම සහ සත්‍ය බවට සහතික කිරීම (නීත්‍යානුකූලභාවය සනාථ කිරීම)** | |
| (1) කේවියට් තහනම | ඇ.ඩො. 30 |
| (2) සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් ලේඛනවල වලංගුභාවය පිළිබඳ සාක්ෂි දැරීම | ඇ.ඩො. 68 |
| (3) දිවුරුම් පත්‍රයක් පිළිබඳ දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම | ඇ.ඩො. 68 |
| (4) දිවුරුම් හෝ ප්‍රතිඥා ගැනීම | ඇ.ඩො. 68 |
| (5) ඇටෝර්නි බලපත්‍රයක හෝ පෙරකලාසියක වලංගුභාවය පිළිබඳ සාක්ෂි දැරීම | ඇ.ඩො. 68 |
| (6) සහතික කරන ලද සත්‍ය පිටපතක් නිකුත් කිරීම | ඇ.ඩො. 12 |
| (7) අන්තිම කැමති පත්‍රයක වලංගුභාවය පිළිබඳ සාක්ෂි දැරීම | ඇ.ඩො. 65 |
| (8) (අපනයන ලේඛන සහ අධ්‍යාපන සහතික හැර) වෙනත් ලේඛනවල වලංගුභාවය පිළිබඳ සාක්ෂි දැරීම- | |
| (අ) ලේඛන හිමියා ශ්‍රී ලාංකික ජාතිකයෙකු නම් | ඇ.ඩො. 43 |
| (ආ) ලේඛන හිමියා විදේශීය ජාතිකයෙකු නම් | ඇ.ඩො. 47 |
| (9) අධ්‍යාපන සහතිකවල වලංගුභාවය පිළිබඳ සාක්ෂි දැරීම | ඇ.ඩො. 12 |
| (10) අපනයන ලේඛන කට්ටලයක වලංගුභාවය පිළිබඳ සාක්ෂි දැරීම | ඇ.ඩො. 60 |
| **6. වෙනත් ලේඛන** | |
| (1) විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ කාර්යය සඳහා ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ජීවිත සහතික ඇතුළු සියලු සහතික | ගාස්තු අය නොකෙරේ |
| (2) ශ්‍රී ලාංකිකයෙකුගේ මෘත දේහය භූමදානය කිරීම හෝ ආදාහනය කිරීමට අදාළ ලේඛන | ගාස්තු අය නොකෙරේ |
| (3) ශ්‍රී ලාංකිකයෙකුගේ මෘත දේහය ගෙන්වා ගැනීමට අදාළ ලේඛන | ගාස්තු අය නොකෙරේ |
| (4)පෙර ශ්‍රී ලාංකිකයෙකුව සිට මියගිය තැනැත්තකුගේ මෘත දේහය හෝ භෂ්මාවශේෂ මෙරටට ගෙන්වා ගැනීම සඳහා ලිපියක් නිකුත් කිරීම | ඇ.ඩො. 30 |
| (5) වෙනත් සියලුම ලිපි හෝ සහතික නිකුත් කිරීම- | |
| (අ) ලේඛන හිමියා ශ්‍රී ලාංකික ජාතිකයෙකු නම් | ඇ.ඩො. 43 |
| (ආ) ලේඛන හිමියා විදේශීය ජාතිකයෙකු නම් | ඇ.ඩො. 50 |
| (6) යුරෝපා සංගමයේ හෝ විදේශීය රියදුරු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රයක් තහවුරු කිරීම | ඇ.ඩො. 60 |
| (7) විරෝධතාවක් නොමැති බවට ලිපියක් නිකුත් කිරීම | ඇ.ඩො. 30 |
| **7. ලේඛන පරිවර්තනය කිරීම** | |
| (1) ලේඛන හිමියා ශ්‍රී ලාංකික ජාතිකයෙකු නම්- | |
| (අ) ලේඛනයක් පරිවර්තනය කිරීම - පළමු වචන 100 සඳහා | ඇ.ඩො. 43 |
| (ආ) සෑම අමතර වචන 25ක් සඳහා | ඇ.ඩො. 7 |

| *I වන තීරය* | *II වන තීරය* |
| --- | --- |
| *කොන්සල් කර්තව්‍ය* | *ගාස්තු* |
| (2) ලේඛන හිමියා විදේශීය ජාතිකයෙකු නම්- | |
| (අ) ලේඛනයක් පරිවර්තනය කිරීම - පළමු වචන 100 සඳහා | ඇ.ඩො. 65 |
| (ආ) සෑම අමතර වචන 25ක් සඳහා | ඇ.ඩො. 7 |

| | |
| --- | --- |
| **තැපැල් ගාස්තු** | අය කරගත යුතු නියම මුදල |

**මොහොමඩ් උවෙයිස් මොහොමඩ් අලි සබ්‍රි,**
විදේශ කටයුතු අමාත්‍ය.

2022 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

EOG 11-0171

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.